PRESS RELEASE

PR23/167

# ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් (ජා.මූ.අ.) කාර්යමණ්ඩලය ශ්‍රී ලංකා සංචාරය නිමා කරයි

වහාම නිකුත් කිරීම සඳහා

ජා.මූ.අ. දූත මණ්ඩලයක නිමාවේ දී නිකුත් කරන මාධ්‍ය නිවේදනවලට රටක් වෙත සිදු කරන සංචාරයකින් පසු ලබා ගත් මූලික සොයා ගැනීම් හඟවන කාර්යමණ්ඩල කණ්ඩායම්වල ප්‍රකාශ ඇතුළත් වේ. මෙම ප්‍රකාශයේ ප්‍රකාශිත අදහස් ජා.මූ.අ. කාර්යමණ්ඩලයේ අදහස් වන අතර, ජා.මූ.අරමුදලෙහි විධායක මණ්ඩලයේ අදහස් අවශ්‍යයෙන් ම නියෝජනය නොකරයි. මෙම කාර්ය මණ්ඩල සංචාරය විධායක මණ්ඩලයේ සාකච්ඡාවකට හේතු නොවනු ඇත.

**කොළඹ, ශ්‍රී ලංකාව - 2023, මැයි 23:** මෑත කාලීන ආර්ථික ප්‍රවණතා සහ ණය පහසුකම් සැලසීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා පීටර් බ්‍රවර් සහ මසාහිරෝ නොසාකි යන මහත්වරුන් විසින් මෙහෙයවනු ලැබූ ජා.මූ.අ. දූත මණ්ඩලයක් 2023, මැයි 11 සිට මැයි 23 දක්වා කොළඹ වෙත කාර්යමණ්ඩල සංචාරයක් සිදු කරන ලදී.

මෙම සංචාරය අවසානයේ දී, බ්‍රවර් සහ නොසාකි යන මහත්වරුන් විසින් පහත ප්‍රකාශය නිකුත් කරන ලදී:

"සංචාරය තුළ දී, අපි මෑත කාලීන සාර්ව ආර්ථික සහ මූල්‍ය අංශ ප්‍රවණතා සාකච්ඡා කළෙමු. ශක්තිමත් ප්‍රතිපත්ති ප්‍රයත්නයන් අනුගමනය කිරීමෙන් පසු, උද්ධමනය මධ්‍යස්ථ වීම, විනිමය අනුපාතික ස්ථාවර වීම සහ ශ්‍රී ලංකා මහ බැංකු සංචිත ස්වාරක්ෂක යළි ගොඩනැඟීමත් සමඟ ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික තත්ත්වය තාවකාලිකව වැඩි දියුණු වීමේ සලකුණු පෙන්නුම් කරමින් තිබේ. කෙසේ වෙතත්, සමස්ත සාර්ව ආර්ථික සහ ප්‍රතිපත්ති පරිසරය තවමත් අභියෝගාත්මක ලෙස පවතියි.

"මෙම ණය පහසුකම් සලසන ලද වැඩසටහන යටතේ ප්‍රධාන කැප කිරීම් සපුරාලීමට බලධාරීන් විසින් ගනු ලබන, දැනට සිදු කරගෙන යන ප්‍රයත්නයන් අපි පිළිගන්නෙමු. මෙම විස්තීරණ ණය පහසුකම් වැඩසටහනෙහි ප්‍රථම සමාලෝචනයේ දී මෙම වැඩසටහන යටතේ කාර්යසාධනය විධිමත් ලෙස ඇගයීමට ලක් කෙරෙනු ඇති අතර, එය 2023 සැප්තැම්බර් මාසයේ දී සිදු කිරීමට අපේක්ෂිත ය. මෙම දූත මණ්ඩලය විසින් සාර්ථක ආදායම් බලමුළු ගැන්වීමක් තහවුරු කිරීම සඳහා ඉතා වැදගත් වනු ඇති අතිරේක රාජ්‍ය මූල්‍ය ප්‍රයත්නයන් සාකච්ඡා කළේය. දේශීය සහ විදේශීය ණයහිමියන් සමඟ දැනට සිදු කෙරෙමින් පවතින සාකච්ඡා සලකා බලමින්, ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධ ප්‍රගතිය පිළිබඳ ව ද අපි සාකච්ඡා කළෙමු. ප්‍රථම සමාලෝචන කාලය වන විට වැඩසටහන් ඉලක්කවලට අනුකූලව ණයහිමියන් සමඟ කාලීනව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම් සාක්ෂාත් කර ගැනීම, ණය තිරසරබව යළි ඇති කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. ප්‍රතිසංස්කරණ වේගය ඉදිරියට පවත්වා ගෙන යෑම සහ මහ බැංකු ස්වාධීනත්වය තහවුරු කිරීම, රාජ්‍ය පාලනය වැඩි දියුණු කිරීමට සහ අවදානමට ලක් වී සිටින පාර්ශ්ව රැක ගැනීම ඇතුළුව වැඩසටහන් කැප කිරීම් කාලීනව ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම, ශ්‍රී ලංකාවට ආර්ථික අර්බුදයෙන් යළි හිස ඔසවා ගැනීමට ප්‍රධාන වේ.

"මෙම දූත කණ්ඩායම ජනාධිපති සහ මුදල් ඇමති වික්‍රමසිංහ මහතා, අධිපති වීරසිංහ මහතා, භාණ්ඩාගාර ලේකම් සිරිවර්ධන මහතා, ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්, විරුද්ධ

පක්ෂවල නියෝජිතයන්, සිවිල් සමාජ සංවිධාන, බුද්ධි මණ්ඩල, වෘත්තීය සමිති, පෞද්ගලික අංශය සහ සංවර්ධන හවුල්කරුවන් හමු විය. විවෘත සහ සහයෝගාත්මක සාකච්ඡා සඳහා බලධාරීන් වෙත අපගේ ස්තුතිය පිරිනමන අතර, අප අතර අඛණ්ඩ සමීප සබැඳියාව ඉදිරියටත් අපේක්ෂා කරන්නෙමු.”